ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.09.12


1. ඒ.එම්.ශෙහාන්,
   විජය කටුපොත,හලාවත

2. ඩබ්.ඒ.රවිහංස ලක්මාල්,
   විජය කටුපොත,හලාවත

3. ඒ.ඒ.ඩී. සසිඳු නිම්සර,
   131, විජය කටුපොත,හලාවත

-විත්දිතයන්-

1. උ.පො.ප චන්ද්‍රසේකර මයා,

2. පො.කො.අබේකෝන් මයා,

3. ස්ථානාධිපති, ප්‍ර.පො.ප ඊ.ඒ.ඩී.දමින්ද සෝමජිත් මයා,
   පොලිස් ස්ථානය,
   ආරච්චිකට්ටුව.

-වගඋත්තරකරුවන්-

පැමිණිලි අංකය : HRC-PTM-SUO-MOTU-48-24

පැමිණිල්ල :-

අන්තර්ජාලයේ වෙබ් පිටුවක පල වූ ළමුන් තිදෙනෙකුට පහර දී නිරුවත්ව ඡායාරූප ලබා ගැනීමේ සිද්ධිය සම්බන්ධව අධ්‍යක්ෂක පරීක්ෂණ සහ විමර්ශන මගින් ලබා දුන් උපදෙස් පරිදි කොමිෂන් සභාවේ මෙහෙයවීමෙන් 2024.05.15 දින නිලධාරී කණ්ඩායමක් විසින් අදාළ ස්ථාන පරීක්ෂණයට ගොස් විත්තිකාර පාර්ශවය හා විත්දිත පාර්ශවයන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලදී.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිල්ල මගින් ඉදිරිපත් කර සිටින කරුණු :-

වින්දිත 1:- A.M ශෙහාන් මදූශංකගෙන් ලබා ගත් ප්‍රකාශය :-

ප්‍රශ්නගත සිද්ධිය සම්බන්ධයෙන් 2024.05.07 දින වයස අවුරුදු 16 ක් වන වින්දිත දරුවාව සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් අත්අඩංගුවට ගෙන ආරච්චිකට්ටුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති අතර පොලිස් කූඩුවේ රඳවා තබා ගනිමින් වරින් වර පිටතට රැගෙන ගොස් පොලිස් නිලධාරීන් නිදාගන්නා කාමරය තුලදී හෝස් බට වලින්ද, අතින්ද පහර දෙමින් නිරුවත් කොට ඇස් වලටද ලිංගික අවයව වලටද මිරිස් තවරමින් වද හිංසා කරමින් 2024.05.07 සිට 2024.05.08 දක්වා වරින් වර ප්‍රශ්න කරන ලද බව පවසයි. ඉන්පසු 2024.05.09 දින හලාවත දිසා රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කර ඇත. අනතුරුව අධිකරණයට ඉදිරිපත් කල බවත්, එහිදී ශරීර ඇප ලැබූ බවත් පවසයි. අනතුරුව කලපුව ආසන්නයේ පිහිටි පොලිස් අධිකාරි කාර්යාලයේ නිලධාරිනියක් කටඋත්තර ලබා ගත් බවත්, එහිදි පොලිසිය විසින් පහර දුන් බව ප්‍රකාශ කල බවත්, ඉන්පසු 2024.05.09 වන දිනම පස්වරුවේ හලාවත දිසා රෝහලේ රෝහල් ගත වී ප්‍රතිකාර ලබා ගත් බවත් 2024.05.10 දින රෝහලෙන් නිදහස් කළ බවත් ප්‍රකාශ කර සිටී.

වින්දිත 2:- විදාන ආරච්චිලාගේ රවිහංස ලක්මාල්ගෙන් ලබා ගත් ප්‍රකාශය

වයස අවුරුදු 16 ක් වන වින්දිත දරුවා 2024.05.07 සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පොලිසියට රැගෙන ගොස් අපරාධ අංශයේ තබාගෙන පහර දී නැවත ත්‍රීරෝද රථයක නංවාගෙන පහර දෙමින් ශෙහාන්ගේ නිවස වෙත රැගෙන ගොස් ශෙහාන්ව අත්අඩංගුවට ගෙන ඔවුන් දෙදෙනාම නැවත පොලිස් ස්ථානයට රැගෙන ගිය බව ප්‍රකාශ කරයි. ඉන්පසු වරින් වර පොලිස් බැරැක්කයේ රඳවා ගනිමින් පහර දී ප්‍රශ්න කිරීම සිදු කොට ඇත. 2024.05.08 දින නැවත ඇස් බැඳ හෝස් බට වලින් පහර දී වරින් වර නිරුවත් කරමින් ලිංගික අවයව වලට හා ඇස් වලට මිරිස් දමා හිංසනයට ලක් කළ බවත් එක් නිලධාරියෙක් ඔහුගේ පෞද්ගලික ජංගම දුරකථනයෙන් නිරුවත් ඡායාරූප ලබා ගනිමින් ඒවා මුහුණු පොතේ පලකරන බවද පවසමින් සොරබඩු ලබා දෙන ලෙස බල කල බව වින්දිත පවසා සිටියි. ඉන්පසු 2024.05.09 වන දින හලාවත රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද බවත් පහර දීම පිලිබඳ තොරතුරු හෙලි නොකරන ලෙස පොලිසියෙන් මරණීය තර්ජනය කළ බැවින් නිහඬව සිටි බවත් පවසයි. අනතුරුව අධිකරණයට ඉදිරිපත් කල බවත් එහිදී ශරීර ඇප ලැබූ බවත් පවසයි. අනතුරුව කලපුව ආසන්නයේ පිහිටි පොලිස් අධිකාරි කාර්යාලයේ නිලධාරිනියක් කටඋත්තර ලබා ගත් බවත්, එහිදි පොලිසිය පහර දුන් බව ප්‍රකාශ කල බවත්, ඉන්පසු 2024.05.09 වන දිනම පස්වරුවේ හලාවත දිසා රෝහලේ රෝහල් ගත වී ප්‍රතිකාර ලබා ගත් බවත් 2024.05.10 දින රෝහලෙන් නිදහස් කළ බවත් ප්‍රකාශ කර සිටී.

වින්දිත 3:- අමදෝරු ආරච්චිලාගේ දෝන් සසිඳු නිම්සරගෙන් ලබා ගත් ප්‍රකාශය

W.A.රවිහංස බැලීමට (වින්දිත 2) සහෝදරිය වන P.D.නිසංසලා 2024.05.08 දින පෙ.ව 10.30 ට පමණ පොලිසියට ගිය අවස්ථාවේදී පොලිසියේ රඳවා තබා ගනිමින් ඇයට 2024.05.08 දහවල් 12ට පෙර වයස අවුරුදු 15ක් වන සසිඳු නිම්සර (එනම් ඇයගේ ඥාති පුත්‍ර) පොලීසියට රැගෙන එන මෙන්ද නැතහොත් P.D.නිසංසලාද රඳවා තබා ගන්නා බවට හා ළමයා ගෙනෙන තෙක් එසේම සිටින ලෙසට තර්ජනය කර ඇත. ඒ අනුව 2024.05.08 සසිඳු නිම්සරව ඔහුගේ ලොකු අම්මා වන J.D.නිරෝෂිණී විසින් ඔහු සමඟ පෙ.ව 11.45 ට පමණ පැමිණ පොලිසියට භාර දීමෙන් අනතුරුව P.D.නිසංසලා මහත්මිය සමඟ සවස 6.30 පමණ වන තෙක් පොලිසියේ රඳවා ගෙන ඇත. එසේම සසිඳු නිම්සර දරුවා අපරාධ අංශයේ රඳවා තබා ගනිමින් පහර දෙමින් ලිංගික අවයවය ලාච්චුවකට දමා තුවාල සිදු කර ඇති අතර රාත්‍රිය පුරාම මාංචු දමා පුටුවකට සම්බන්ධ කොට තබා ඇත. ඉන්පසු 2024.05.09 වන දින හලාවත රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද බවත් පහර දීම පිලිබඳ තොරතුරු හෙලි නොකරන ලෙසත් එසේ කලහොත් නැවත රඳවාගෙන පහර දෙන බවට තර්ජනය කළ බැවින් නිහඬව සිටි බවත් පවසයි. අනතුරුව අධිකරණයට ඉදිරිපත් කල බවත් එහිදී ශරීර

ඇප ලැබූ බවත් පවසයි. අනතුරුව කලපුව ආසන්නයේ පිහිටි පොලිස් අධිකාරි කාර්යාලයේ නිලධාරිනියක් කටඋත්තර ලබා ගත් බවත්, එහිදී ඔහුට පහර දුන් බව ප්‍රකාශ කල බවත්, ඉන්පසු 2024.05.09 වන දිනම පස්වරුවේ හලාවත දිසා රෝහලේ රෝහල් ගත වී ප්‍රතිකාර ලබා ගත් බවත් 2024.05.10 දින රෝහලෙන් නිදහස් කළ බවත් ප්‍රකාශ කර සිටී.

පැමිණිල්ලට අදාළව වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර සිටින ප්‍රකාශ

2024/04/21 දින සිදු වූ රාත්‍රී කාලයේ නිවසක් බිඳ දේපළ සොරකම් කිරීමක් සම්බන්ධව ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු තොරතුරු හා වැඩිදුර විමර්ශනයේදී අනාවරණ වූ තොරතුරු මත පදනම් ව මෙම අත්අඩංගුවට ගැනීම සිදු කල බවට පොලිස් ස්ථානාධිපති ප්‍ර.කො.ප දමින්ද ඉන්ද්‍රජිත් සිය ප්‍රකාශයේ සඳහන් කරයි. 2024/06/11 දින පුත්තලම උප කාර්යාලයේදී පැවති පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවයන් ප්‍රකාශ කර සිටියේ සැකකරුවන්ගේ පෙර හැසිරීම මත පදනම්ව මෙම අත්අඩංගුවට ගැනීම සිදු කල බවයි.

මෙම රාත්‍රී කාලයේ නිවසක් බිඳ දේපළ සොරකම් කිරීමේ සිද්ධිය සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයන් 2024/04/21 දින සිදු කර ඇති අතර මූලික විමර්ශනය අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන් සහ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්ගේ සහභාගීත්වයෙන් සිදු කර ඇත.

2024/05/08 උ.පො.ප චන්ද්‍රසේකර පො.කො 100707 අබේකෝන් සමග දිවා සංචාරය සඳහා බල අපරාධ 18/2024,19/2024,17/2024 සම්බන්ධ වැඩිදුර විමර්ශනයට YP8378 ත්‍රීරෝද රථයෙන් පිටත් වූ බවත් එහිදී A.M. ශෙහාන් මදුශංක W.A. රවිහංස ලක්මාල් යන වින්දිතයින් සැක සහිත ලෙස බෝක්කුවක් මත සිටියදී අදාල ස්ථානයේ රැඳී සිටීමට හේතු විමසීමේදී නිසි පිළිතුරක් නොලැබුනු බවත් සැකකරුවන් පරීක්ෂා කල විට කිසිදු සොරාගත් දේපලක් නොතිබූ බවත් අත්අඩංගුවට ගැනීමේදී චූදිතයින් දිවීමට උත්සහ කිරීම නිසා පාලම මත ඇද වැටුනු බවත් සටහන් කර සිටී. පසුව ගම්වාසීන්ගෙන් ලැබුණු තොරතුරු මත පදනම්ව ගෙවල් බිඳීම සම්බන්ධයෙන් සැක පිට ප්‍රශ්න කිරීම සඳහා පැය 14:20 ට ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගත් බවත් සටහන් කර ඇත.

පසුව තවදුරටත් සංචාරයේදී 61 හංදිය මාර්ගය වම්පස වසා ඇති කඩ පේලියෙහි සැකකටයුතු ලෙස රැඳී සිටි A.A.D. සසිඳු නිම්සර ප්‍රශ්න කල බවත්, බියෙන් තැතිගෙන සිටි ඔහු විසින් ප්‍රශ්න වලට නිසි ලෙස පිළිතුරු දීමට අපොහොසත් වීම නිසා පැය 15:00 ට අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. ඉන්පසු විමර්ශන අවසන් වන තුරු මෙම චූදිතයින් තිදෙනා උප සේවක පො.කො 17026 නිලධාරියාට භාර දී ඇති අතර මොවුන් බාල වයස්කරුවන් බව උපසේවා නිලධාරියාට සඳහන් කල බවත් AMIS පෝරම සම්පූර්ණ කිරීමට හා සැකකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමට කටයුතු කල බවත් සඳහන් කර ඇත.

වින්දිත ළමුන් තිදෙනා වරද පිළිගෙන සිදුකළ පාපොච්චාරණයන් වල ස්වභාවයන් තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය විසින් බල අපරාධ පොතින් උපුටා දක්වා ඇති අතර එම ප්‍රකාශ වලට අනුව ඔවුන් සොරකම පිළිබඳ චෝදනාව පිළිගන්නා අතර පොලිස් නිලධාරීන් ඔවුන්ට කිසිදු පහර දීමක් සිදු නොකළ බවද පිළිගනී.

සැකකාර ළමුන් තිදෙනා 2024/05/08 දින සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. චූදිත ළමුන් තිදෙනාගෙන් ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කර ගැනීමේදී (වින්දිත 3) A.A.D.සසිඳු නිම්සර විසින් සිදු කරන ලද ප්‍රකාශයට අනුව වැඩිදුර විමර්ශන කටයුතු සිදු කර 2024/05/09 වන දින වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රාත්‍රී කාලයේ නිවසක් බිඳ රු.40000/= ක් වටිනා ජංගම දුරකථනයක් හා මුදල් රු.20000/= ඇතුළු රු.60000/= ක් වටිනා දේපල සොරකම් කිරීමේ චෝදනාව මත හලාවත මහේස්ත්‍රාත් උසාවිය බි 779/2024 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කල අතර ගරු මහේස්ත්‍රාත්තුමා විසින් සැකකරුවන් තිදෙනා ඇප මත නිදහස් කල බව සඳහන් කරයි.

තවදුරටත් බාලවයස්කාර වින්දිතයින්ට පහර දුන් බවට නැගෙන චෝදනාව චූදිත නිලධාරීන් දෙදෙනා තරයේ ප්‍රතික්ෂේප කරන අතර පොලිසිය විසින් ලබා ගන්නා ලද වින්දිත ළමුන්ගේ ප්‍රකාශ හා අධිකරණ වෛද්‍ය පෝරම, පහර දීමක් සිදු නොවූ බවට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇත.

එසේම මෙම සැකකරුවන් නිදෙනා අත්අඩංගුවේ සිටියදී මෙම සැකකරුවන්ගේ ඥාති කාන්තාවක් වන P.D.නිසංසලා නීතිවිරෝධී ලෙස රඳවා තබා ගැනීමක් සිදු නොකල බවට ස්ථානාධිපතිතුමා තම ප්‍රකාශයේ දක්වයි. එසේම සැකකරුවන්ගේ ඥාතීන් හෝ වෙනත් අවශ්‍යතාවයක් සඳහා පොලිසියට පැමිණෙන සියලූ දෙනා පොලිස් ස්ථානයේ පිටත ඇති අසුන් වල අසුන් ගෙන සිටීම පමණක් සාමාන්‍යයෙන් සිදු වන බව වැඩිදුරටත් කරුණු දක්වයි.

පරීක්ෂණයේදී ඉදිරිපත් වූ කරුණු:-

කොමිෂන් සභාව විසින් සිය මෙහෙයවීමෙන් ආරම්භ කළ, පරීක්ෂණයක් බැවින් 2024/05/15 වන දින අදාල ස්ථාන පරීක්ෂාවට පුත්තලම මානව හිමිකම් කාර්යාලයේ නිලධාරීන් ගොස් ඇති අතර වින්දිතයින් හා වගඋත්තරකරුවන්ගෙන් අදාල සිදුවීම පිළිබඳ ප්‍රකාශ ලබා ගෙන ඇත. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පුත්තලම කාර්යාලයේ දී අවස්ථාවන් දෙකකදී අදාළ පාර්ශවයන් කැඳවූ නමුත් 2024.06.04 දින වගඋත්තරකරුවන් හේතු දැක්වීමකින් තොරවම නොපැමිණි අතර වින්දිතයන් පමණක් පැමිණ සිටියහ. අනෙක් අවස්ථාවේදී දෙපාර්ශවයේම සහභාගීත්වයෙන් පුත්තලම උප කාර්යාලයේදී 2024/06/11 වන දින පරීක්ෂණය මෙහෙයවන ලදී.
මෙදින පරීක්ෂණයේදී වින්දිතයින්ගේ ඥාතිවරයෙකු වන ජයලත් පේඩිගේ නිරෝෂිණි, සසිඳු නිම්සරව අත්අඩංගුවට ගැනීමේදී මුහුණ දුන් සිදුවීම ප්‍රකාශයක් ලෙස ලබා දෙන ලද අතර 2024.06.11 දින දෙපාර්ශවයම සහභාගී වූ පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලදී.

1. මෙම ළමුන් අත්අඩංගුවට ගැනීම පිළිබඳව
2. පහර දීම පිළිබඳව
3. මෙම ළමුන්ගේ ඥාතිවරියක පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීම පිළිබඳව

2024.05.08 දින වින්දිතයින් අත්අඩංගුවට ගෙන පසු දින අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ බවත්, මෙහිදී කිසිදු අවස්ථාවක පහර දීමක් සිදු නොවූ බවත්, ඔවුන්ගේ පෙර ප්‍රශ්න සහගත හැසිරීම මත අත්අඩංගුවට ගැනීම සිදු කළ බවත්, තවද මෙම සැකකරුවන් වෙනුවෙන් කිසිදු කාන්තාවක් රඳවා ගෙන නොසිටි බවත්, වින්දිතයන්ගේ චෝදනාවලට අදාළව වගඋත්තරකරුවන් විසින් කරුණු දක්වා සිටින ලදී.

ඒ.එම්.ෂෙහාන් මදුශංඛ 2024/04/24 දින උක්ත චෝදනාව සම්බන්ධයෙන්ම අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයෙන් පරිභාහිර ස්ථානයක රඳවා තබා ගනිමින් වදහිංසාවට ලක් කරමින් ප්‍රශ්න කරන ලද බව වින්දිතයින්ගේ ප්‍රකාශ වලින් පැහැදිලි වේ. 2024/06/11 පැවැති පරීක්ෂණයෙන් වගඋත්තරකාර පාර්ශවයෙන් මෙවන් අත්අඩංගුවට ගැනීමක් සිදු වූ බව පිළිගත්තද, වධහිංසා කිරීමක් සිදු නොකල බව පවසා සිටියි.

අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් අනාවරණය වූ කරුණු :

වින්දිත- 1 A.M. ශෙහාන් මධුශංක

තුවාල වල ස්වභාවය:

1. තැලුම් ලකුණක් 10 cm * 9 cm ප්‍රමාණයේ පසුවේ පිටුපස දකුණු පැත්තේ පිහිටා ඇත.

2. තැලුම් ලකුණක් 6 cm * 4 cm ප්‍රමාණයේ පසුවේ පිටුපස වම් පැත්තේ පිහිටා ඇත.

වෛද්‍ය මතය

ඉහත 1,2 තුවාල බරපතල නොවන ගණයේ තුවාල (Non -grievous injuries )බව දන්වා ඇත.

වින්දිත- 2 W.A රවිහංස ලක්මාල්

තුවාල වල ස්වභාවය :

1. 'Tramline Contusion' (වේවැල්, වයර්, බැටන්, රබර් හෝස් PVC Pipes වැනි යමකින් සම මත යොදන ලබන පීඩනයකින් ඇති වන තැලුම් තුවාල මත එම උපකරණයෙහි කෙලවර මගින් ඇති වන සමාන්තර රේඛීය තුවාල. Tram line contusions are caused from (pdn.ac.lk) 3cm * 1cm ප්‍රමාණයේ පසුපස ප්‍රදේශයේ වම් පස කලවය.

2. 'Tramline Contusion' 4cm * 1cm ප්‍රමාණයේ පසුපස ප්‍රදේශයේ දකුණු පස කලවය.

3. සීරුම් ලකුණක් 05cm * 0.5cm ප්‍රමාණයේ පපුවේ පිටුපස දකුණු පැත්තේ පිහිටා ඇත.

4. රේඛීය සීරුම් ලකුණක් 1 cm දිගින් යුතු ඉදිරිපස හා පිටුපස මැණික්කටුව සංධිය ප්‍රදේශයේ ඇත. පපුවේ පසුපස ප්‍රදේශයේ ඉහළ කොටසේ සහ තට්ටම් ප්‍රදේශයේ මෘදු බවක් (tender)දක්නට ඇත.

වෛද්‍ය මතය

ඉහත 1,2,3,4 තුවාල බරපතල නොවන ගණයේ තුවාල (Non -grievous injuries)බව දන්වා ඇත.

වින්දිත- 3 K.A.D සසිඳු නිම්සර

තුවාල වල ස්වභාවය :

තුවාල නොමැත.
( BHT අනුව පුරුශ ලිංගයේ කිසිදු තුවාලයක් නොමැත.)

වෛද්‍ය මතය

බරපතල නොවන තුවාල (Non - grievous injuries ) නැත.

මෙම වාර්තාව අනුව (වින්දිත 3) A.A.D. සසිඳු නිම්සරට තුවාල සිදු වී ඇති බවට අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් තහවුරු නොවේ. ( වින්දිත 1) A.M. ශෙහාන් මදුශංඛ හා (වින්දිත 2) W.A.රවිහංස ලක්මාල්ට බරපතල නොවන ගණයේ තුවාල සිදුව ඇති බවට අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් තහවුරු වේ.

නිරීක්ෂණ

- මෙහිදී අත්අඩංගුවට ගැනීමක් සිදුවී ඇති බව දෙපාර්ශවයම පිළිගනී.

- අත්අඩංගුවට ගත් වූදිතයින් තිදෙනාම එනම්, A.M.ශෙහාන් මධුශන්ක (අවුරුදු 16), W.A.රවිහංස ලක්මාල් (අවුරුදු 16), A.A.D. සසිඳු නිමසර (අවුරුදු 15) බාලවයස්කරුවන් බව නිරීක්ෂණය වේ.

- අත්අඩංගුවට ගැනීමට හේතු ලෙස වගඋත්තරකාර පාර්ශවය දක්වන්නේ ප්‍රදේශවාසින් ලබා දුන් තොරතුරු , වැඩිදුර විමර්ශනයේදී ලැබුණු තොරතුරු ආදියයි. නමුත් අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරින් යොදා ගෙන කරන ලද පරීක්ෂණයේදී හෝ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරින් යොදා කරන ලද පරීක්ෂාවේදී හෝ කිසිදු පරිවේෂණීය සාක්ෂියක් වින්දිතයින්ට විරුද්ධව ලැබී නොමැති බව නිරීක්ෂණය වේ. එසේම

ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු තොරතුරු පිලිබඳ ස්ථානාධිපතිතුමාගෙන් ප්‍රශ්න කල අවස්ථාවේදී එය රහස්‍ය වාචික තොරතුරක් බව පමණක් ප්‍රකාශ කර සිටියි. එම තොරතුරු ලබා දුන් ප්‍රදේශවාසීන්ගේ නම හෝ තොරතුරු කුමක්ද යන්න පවා පොලිසිය විසින් හෙළිදරව් නොකරයි.

- එසේම A.M.කල්‍යාණි නවරත්න නැමති ගෙවල් බිඳුමට ලක් වූ නිවැසි කාන්තාවගේ ප්‍රකාශය තුල පවා මෙම සැකකරුවන් තිදෙනා සොරකමට සැක කරන බවට දක්වා නොමැති අතර සොරකම් කරන ලද භාණ්ඩ පවා ඔවුන් පරීක්ෂා කිරීමේදී හමු වී නොමැති තත්ත්වයක් යටතේ සිදු කරන ලද මෙම අත්අඩංගුවට ගැනීම නීතිමය රාමුවෙන් පරිභාහිරව සිදු කරන ලද්දක් බව පෙනී යයි. අත්අඩංගුව ගැනීම සිදු කල අවස්ථාවේදී A.M.ශෙහාන් මධුශංඛ හා යන වින්දිත W.A.රවිහංස ලක්මාල් යන වින්දිත දරුවන් දෙදෙනා පලා යෑමට උත්සහ කිරීමේදී පාලම මත ඇද වැටුණු බව වගඋත්තරකරුවන් සඳහන් කර ඇත. එසේ සිදු වූවා නම් එම දරුවන් ප්‍රතිකාර සඳහා යොමු කිරීමක් ඔහු විසින් හෝ දරුවන්ව භාර දුන් උප සේවක නිලධාරියා විසින් හෝ සිදු කල යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේම ඒ පිලිබඳ උපසේවක විසින් කිසිඳු සටහනක්ද තබා නොමැති බව පෙනී යයි. අත්අඩංගුවට ගත් සැකකරුවන් බාල වයස්කරුවන් වන බැවින් පොලිස් නිලධාරින් මෙම ආකාරයෙන් ක්‍රියා කිරීම පටිපාටිවලට අනුකූල නොවන බවද නිරීක්ෂණය වේ. එය එසේ නම් වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන පරිදි අත්අඩංගුවට ගත් 2024/05/08 දිනම වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් නොකර 2024/05/09 දින වෛද්‍යවරයෙකු හමුවට ඉදිරිපත් කර තිබීම අවධානයට ලක් වේ.

- මෙම අත්අඩංගුවට ගැනීම සිදුවූ ආකාරය සම්බන්ධව දෙපාර්ශවය පවසන කරුණු එකිනෙකට වෙනස් වන බව අනාවරණය විය. ඒ අනුව, වගඋත්තරකාර පාර්ශවයට අනුව පොලිස් දිවා මුර සංචාරයකදී ලැබූ තොරතුරු හා වින්දිතයන්ගේ සැක සහිත හැසිරීම් මත පදනම්ව මෙම අත්අඩංගුවට ගැනීම 2024/05/08 මහාමාර්ගයේදී සිදුකර ඇත.

  නමුත් වින්දිත පාර්ශවයට අනුව, A.M.ශෙහාන් මධුශන්ක, W.A.රවිහංස ලක්මාල් යන වින්දිතයන්ව නිවෙස් වලට ගොස් 2024/05/07 අත්අඩංගුවට ගෙන ඇත. පසුව P.D. නිසංසලා නැමති W.A.රවිහංස ලක්මාල්ගේ සහෝදරිය 2024/05/09 වන දින පෙ.ව 10:20 ට පමණ සිය සහෝදරයා වන W.A.රවිහංස ලක්මාල්ව බැලීමට පොලිස් ස්ථානයට ගොස් ඇති අතර, එම අවස්ථාවේදී ඇයව බලහත්කාරයෙන් පොලිස් ස්ථානය තුල රඳවා තබාගෙන, A.A.D.සසිඳු නිම්සරව දවල් 12.00 ට පෙර පොලිසියට ගෙනවිත් භාර කරන තෙක් ඇයට පොලිස් ස්ථානයෙන් පිටවීමට ඉඩ දී නොමැත. A.A.D.සසිඳු නිම්සරව භාර දීමට ගිය ඥාතිවරියක වන ජයලත් පේඩිගේ නිරෝෂිණී කුමාරිගේ දිවුරුම් ප්‍රකාශය අනුවද මෙය තහවුරු වේ.

- ජයලත් පේඩිගේ නිරෝෂිනි කුමාරි නැමති (වින්දිත 3) A.A.D.සසිඳු නිම්සරගේ මවගේ වැඩිමහල් සහෝදරිය විසින් මෙම දරුවාද කැටුව දහවල් 12ට පෙර පොලිස් ස්ථානයට වාර්තා කොට ඇත. එම අවස්ථාවේදී අත්අඩංගුවේ පසුවූ A.M.ශෙහාන් මධුශන්ක හා W.A.රවිහංස ලක්මාල් යන වින්දත දරුවන් දෙදෙනාත්, P.D. නිසංසලාත් J.D.නිරෝෂිණී කුමාරි හා A.A.D.සසිඳු නිම්සරත් පොලිස් ස්ථානාධිපතිගේ නිලමැදිරියේ තබාගෙන අසභ්‍ය වචනයෙන් බනිමින් තර්ජනය කරමින් ප්‍රශ්න කර ඇති බවද පැමිණිල්ල ප්‍රකාශ කරයි.

  P.D. නිසංසලා මෙම ගෙවල් බිඳුම සඳහා ළමුන් මෙහෙයවූ බවත්, J.D.නිරෝෂිනි කුමාරි යන අය A.A.D.සසිඳු නිම්සරව පොලිසියෙන් සඟවා තබාගත් බවටත්, පොලිසිය විසින් චෝදනා කොට ඇති අතර පොලිස් ස්ථානයෙන් පිටතට යාමට නොදී සිරමැදිරිය අසල පුටුවක ප.ව 4.15 වන තෙක් රඳවා තබා ගෙන ඇත. නීතිඥවරයා පැමිණීමට මොහොතකට පෙර මෙම කාන්තාවන් දෙදෙනා නිදහස් කර ඇති බව 2024/09/02 දින P.D. නිසංසලා හා J.D.නිරෝෂිනි කුමාරි යන අය මානව හිමිකම් කොමිෂන් සභාවේ කොළඹ කාර්යාලයේදී ලබා දුන් ප්‍රකාශ අනුව පැහැදිලි වේ.

- අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමේදී සිදුකළ නිරුවත් කර ඡායාරූප ගැනීම, පහරදීම් හා අනෙකුත් වධහිංසා පිළිබඳ චෝදනා වගඋත්තරකාර පාර්ශවය ප්‍රතික්ෂේප කරන අතර ඒ සඳහා සාක්ෂි ලෙස අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය ( Medico Legal Examination Form) හා ළමුන්ගේ ප්‍රකාශ දක්වයි. 2024/05/09 වන දින පොලිසිය විසින් ඉදිරිපත් කරන අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය තුල දක්වා ඇති වෛද්‍ය මතය හා එදිනම පස්වරුවේ රෝහල් ගත වීමෙන් අනතුරුව කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු එකිනෙකට

වෙනස් බව නිරීක්ෂණය වේ. ඒ අනුව පොලිසිය විසින් දක්වන අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම ( Medico Legal Examination Form) පිළිගත නොහැකි බව පෙනී යයි. බාල වයස්කරුවන් යනු ශාරීරික හා මානසික වශයෙන් ශක්නුවත් නොවන පහසුවෙන් වින්දිතභාවයට පත් විය හැකි කණ්ඩායමක් බැවින් ඔවුන් බිය වැද්දීම හේතුවෙන් පොලිසිය හමුවේදී සිදු කල මෙම ප්‍රකාශ වල වලංගුභාවයක් නොපවතින බවද නිරීක්ෂණය වේ.

- අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය ( Medico Legal Examination Form) තුළ සදහන් කරුණු හා අධිකරණ වෛද්‍ය වාර්තාවන්හි කරුණු එකිනෙකට වෙනස් වන නමුත්, අධිකරණ වෛද්‍ය වාර්තාව, වින්දිත ළමුන් අධිකරණයට ඉදිරිපත් වීමෙන් අනතුරුව නිවෙස් බලා නොගොස් අධිකරණයේ සිට රෝහල වෙත ගොස් රෝහලේ නේවාසිකව සිටිමින් ලබා ගත්තක් බැවින් වින්දිතයින් එකී තුවාල චේතනාන්විතව ස්වයංව සිදුකර ගනු ලැබූ තුවාල යන වගඋත්තරකරුවන්ගේ වාචික ප්‍රකාශය පිළිගත නොහැක. ඒ අනුව, අධිකරණ වෛද්‍ය වාර්තාව වඩා ස්වාධීන විශ්වසනීය සාක්ෂියක් ලෙස සැළකීම නිරවද්‍ය වේ.

- අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවන් ඉහත දක්වා ඇති අතර ඒ අනුව බරපතල නොවන තුවාළ පිළිබඳ දැක්වෙන විස්තරය වින්දිතයින්ගේ කටඋත්තර සමග මනාව සැසඳෙන බව නිරීක්ෂණය වේ.

  වින්දිත W.A .රවිහංස ලක්මාල්ගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ "Tramline Contusion" පිළිබඳ සදහන් වන අතර වෛද්‍ය විද්‍යාවේ මෙම පාරිභාෂිත වදන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධිකරණ වෛද්‍ය වෙබ් අඩවිය මගින් පහත පරිදි අර්ථ දක්වා ඇත. ඒ අනුව "Tramline Contusion" යනු " වේවැල් , වයර්, බැටන්, රබර් හෝස් PVC Pipes වැනි යමකින් සම මත යොදන ලබන පීඩනයකින් ඇති වන තැලුම් තුවාල මත එම උපකරණයෙහි කෙලවර මගින් ඇති වන සමාන්තර රේඛීය තුවාල." Tram line contusions are caused from (pdn.ac.lk)
  මෙම තුවාල ඇති කරන ලද උපකරණය ලෙස "වතුර දැමීමට යොදා ගන්නා නිල්පාට හෝස් බටයකින්" පහර දුන් බව රවිහංස ලක්මාල් තම කටඋත්තරයේ සදහන් කොට ඇත.

  මේ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් හෙලි වන වෛද්‍ය සාක්ෂිය හා වින්දිතගේ ප්‍රකාශයේ සදහන් වද හිංසාව පිලිබද කරුණු මනාව ගැළපෙන බව නිරීක්ෂණය වේ.

- කෙසේ වෙතත් පහර දීම හැරුණු කොට නිරුවත් කොට ඡායාරූප ගැනීම සම්බන්ධ චෝදනාව ඔප්පු කිරීමට වින්දිත පාර්ශවයේ සාක්ෂි ප්‍රමාණවත් නොවේ.

නිගමනය.

අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 79 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ අනුමිත කාර්යපටිපාටිය එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාවේ සදහන් "නීතියේ නිසි කාර්යපටිපාටිය" අනුව එය සිදුකළ යුතුය. නමුත් මෙම 1,2,3 වින්දිතයින් අත්අඩංගුවට ගැනීම "හුදු සැකය" මත පදනම්ව ප්‍රාදේශවාසීන්ගේ තොරතුරු මත යැයි ප්‍රකාශ කරමින් එවැනි තොරතුරක් ලැබුණේ නම් එම තොරතුරු නිසි විමර්ශනය කිරීමකින් තොරව හා පරිවේශණීය සාක්ෂි වලින් තහවුරු කරගැනීමකින් හෝ තොරව සිදුකර ඇත. නීතිඥ සංජීව (ජෙරාඩ් මර්වින් පෙරේරා වෙනුවෙන්) එදිරිව සේන සූරවීර ස්ථානාධිපති වත්තල නඩුවේදී අධිකරණය ප්‍රකාශ කළේ ඔත්තුව පිළිබදව ප්‍රමාණවත් කරුණු තහවුරු කරගෙන නොමැති වීම මත අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී වන බවයි. තවදුරටත්, ප්‍රේමලාල් ද සිල්වා එදිරිව ස්ථානාධිපති රොද්‍රිගෝ නඩුකරෙයේදී, අධිකරණයේ මතය වූයේ, හුදු සැකය, නරක චරිතය ආදිය මත අත්අඩංගුවට ගෙන යමක් එළිදරව්වේ යන පදනම මත ප්‍රශ්න කිරීම නීතිවිරෝධී වන බවයි.

මේ සියලු කරුණු මත පදනම්ව නිගමනය කළ හැක්කේ, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව "නිතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට පටහැනිව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බැවින් 13 (1) වන ව්‍යවස්ථාවේ සදහන් මූලික අයිතිවාසිකම A.M ශෙහාන් මධුශන්ක, W.A රවිහංස ලක්මාල්, A.A.D සසිඳු නිම්සර නැමති වින්දිත දරුවන් සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව "කිසිම තැනැත්තකු වද හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන්න අනුල්ලංඝනීය ( Non-derogable ) අයිතිවාසිකමක් වශයෙන් සහතික කොට ඇත.

නවසිවායම් එදිරිව ගුණවර්ධන නඩුකරයේදී 11 වන වගන්තිය කඩ වීම යන්න ස්ථාපනය කිරීමේදී වෛද්‍ය වාර්තා වැදගත් වන බව දක්වා ඇත. ඒ අනුව පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීමේදී වින්දිතයන්ට සිදු කරන ලද පහර දීම් වද හිංසා ආදිය පිළිබඳ අධිකරණ වෛද්‍ය වාර්තාවේ දැක්වෙන වෛද්‍ය සාක්ෂි හා කටඋත්තර ඉතා ඉහළ සම්භාවිතාවකින් සැසදෙන බව නිරීක්ෂණය වේ. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව නිගමනය කළ හැක්කේ, A.M. ශෙහාන් මධුශන්ක, W.A .රවිහංස ලක්මාල් යන වින්දිත දරුවන් දෙදෙනා පොලිස් භාරයේ රඳවා තබා ගැනීමේදී පහර දීම් සහ වධ හිංසා වලට ලක්ව ඇති බවයි. එසේ වුවද A.A.D. සසිඳු නිමසර පහර දීම් සහ වධ හිංසා වලට ලක්ව ඇති බවට වෛද්‍ය සාක්ෂි මගින් ප්‍රමාණාත්මකව තහවුරු වී නොමැත.

මෙම වදහිංසා සහ පහර දීම් සම්බන්ධව විත්තිවාචක ලෙස චූදිත පොලිස් නිලධාරීන් දක්වන වින්දිතයන්ගේ පාපොච්චාරණයන්හි 1991 සාක්ෂි ආඥා පනතේ 25 වගන්තිය යටතේ නෛතික වලංගු භාවයක් නොමැත. එසේම ළමයින් සම්බන්ධව අවස්ථානුගත කරුණු මත එම ළමයින්ගේ ප්‍රකාශ ස්වේච්ඡාවෙන් කල බව පිළිගැනීමේ හැකියාවක් ද නොපවතියි.

ඉහත කරුණු මත පදනම්ව මෙම සිදුවීම තුළ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව 1,2 වින්දිත දරුවන් සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව නිගමනය කරමු.

එසේම P.D නිසංසලා 2024.05.08 දින ,පෙ.ව 10.20 සිට ප.ව 04.15 වන තෙක් මෙම ගෙවල් බිඳුම සඳහා ළමුන් මෙහෙයවූ බවට චෝදනා කරමින් , A.A.D.සසිඳු නිමසරව පොලිසියට භාර දෙන තෙක් ඇපකරුවෙක් ලෙස පොලිස් ස්ථානයෙන් පිටතට යාමට නොදී සිරමැදිරිය අසල පුටුවක රඳවා ගෙන ඇති බවද අනාවරණය වී ඇත. A.A.D.සසිඳු නිමසරව පොලිසියට භාර දුන් පසුත්, නීතිඥවරයා පැමිණෙන මොහොත දක්වාම P.D නිසංසලා බලහත්කාරයෙන් රඳවා තබා ගැනීම තුළ, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම වින්දිත කාන්තාව සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

තවදුරටත්, පොලිසිය විසින් චූදිතයන් හා බාලවයස්කාර ළමුන් තිදෙනා සම්බන්ධව කටයුතු කිරීමේදී, බාලවයස්කාර ළමුන් අත්අඩංගුවට ගැනීමකදී අනුගමනය කළ යුතු ශ්‍රී ලංකාව විසින් අපරානුමිත කර ඇති එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 37 වගන්තියේ දැක්වෙන මානව හිමිකම් මූලධර්ම උල්ලංඝනය වන පරිදි කටයුතු කර ඇත.

එනම්, 37 (a) ළමුන් වද හිංසාවට ලක් නොකළ යුත්තේය, 37(b) ළමුන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම නීත්‍යානුකූල විය යුතුය, 37(c) නිදහස අහිමි කරන ලද ළමුන්ට මානුෂිකව හා ගරුත්වයෙන් සැලකිය යුතුය, 37(d) අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීමට ළක්වන දරුවන්ට නීතිය හා අනෙකුත් උපකාර වෙත කඩිනමින් ප්‍රවේශ වීමට ඇති අයිතිය යනාදියයි.

ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.

1) 1 සහ 2 වගඋත්තරකරුවන් විසින් එක් වින්දිත දරුවෙකුට රු.20,000 ක බැගින් වූ මුදලක් (එනම් රු.60,000ක්) 1,2,3, වින්දිත දරුවන් වෙත ගෙවිය යුතු වේ.

2) 1 සහ 2 වගඋත්තරකරුවන් විසින් රු.10,000ක මුදලක් වන්දි පී.ඩී. නිසංසලා යන අයට ගෙවිය යුතු වේ.

3) 3 වගඋත්තරකරු විසින් අධීක්ෂණ වගකීම හා ඔහු ක්‍රියාකර ඇති ආකාරය අනුව, P.D.නිසංසලා වෙත රු.10,000ක මුදලක් ද, වින්දිත දරුවන් තිදෙනා වෙත රු.15,000 ක මුදලක් ද ගෙවිය යුතුය.

4) 1, 2, 3 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිලිබඳව විනය පරීක්ෂණයක් පවත්වා වගඋත්තරකාර පාර්ශවය සම්බන්ධව විනය පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.

2024. 10 . 25 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව වින්දිත පාර්ශවය විසින් කොමිෂන් සභාවට දැනුම් දීය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 1. අමාත්‍යතුමා , මහජන ආරක්ෂක අමාත්‍යාංශය,

04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

2. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය.